**මධ්‍යම පළාත්, පළාත් පාලන ආයතන වල ආදායම් පරීක්ෂක සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු සඳහා වූ පරිපාටිය**

## 01. හැඳින්වීම

ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන පරිදි, මධ්‍යම පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ වන පළාත් පාලන ආයතන වල සේවයේ නිරත ආදායම් පරීක්ෂක සේවයේ නිලධාරීන් පළාත් පාලන ආයතන අතර ස්ථාන මාරු කිරීම සඳහා මෙම ස්ථාන මාරු පරිපාටිය අදාල වේ. මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලද දින සිට මෙම පරිපාටිය ක්‍රියාත්මක වේ.

මෙම ස්ථාන මාරු පරිපාටිය අනුව සේවයේ පත්කිරීම් බලධාරියා වන මධ්‍යම පළාත්,පළාත් පාලන කොමසාරිස් විසින් පිහිටුවනු ලබන ස්ථාන මාරු මණ්ඩලයක් විසින් වාර්ෂික ස්ථාන මාරු සඳහා කැඳවනු ලබන අයදුම්පත් සහ අනෙකුත් විස්තර සලකා බලා ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මත,මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස් විසින් ස්ථාන මාරු තීරණ නිකුත් කරනු ලැබේ.

## 02. ස්ථාන මාරු ප්‍රතිපත්තිය

### 2.1 වාර්ෂික නොවන ස්ථාන මාරු

පහත දැක්වෙන අවස්ථා වලදී, පළාත් පාලන කොමසාරිස් විසින් ස්ථාන මාරු නියෝග නිකුත් කරන අතර, එය ස්ථාන මාරු ප්‍රතිපත්තියට ඇතුලත් නොවේ.

i. පරිපාලනමය හා සේවා අවශ්‍යතාවය මත කළ යුතු මාරු කිරීම්
ii. විනය හේතු මත කෙරෙන ස්ථාන මාරු කිරීම්
iii. සාමාන්‍ය රාජකාරි කටයුතු වලට බාධාවක් නොවන සුහද ස්ථාන මාරු කිරීම්
iv. විශේෂ වෛද්‍ය හේතු මත කෙරෙන මාරු කිරීම්
v. සේවකයින්ගේ හදිසි හා සානුකම්පිතව සලකා බැලිය යුතු වූ කරුණු හේතුවෙන් කෙරෙන මාරු කිරීම්

### 2.2 වාර්ෂික ස්ථාන මාරු

ඉහත වාර්ෂික නොවන ස්ථාන මාරු යටතේ කෙරෙන ස්ථාන මාරුවීම් හැර, ස්ථාන මාරු වීම් අපේක්ෂා කරන නිලධාරීන්ගේ ඉල්ලීම් ඉටු කිරීම සඳහා ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන පරිදි, වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය ක්‍රියාත්මක කෙරේ.

### 2.3 වාර්ෂික ස්ථාන මාරු ක්‍රමය සඳහා යටත්වන මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනවල ආදායම් පරීක්ෂක සේවයේ ශ්‍රේණීන්,

i. ආදායම් පරීක්ෂක සේවයේ I ශ්‍රේණිය
ii. ආදායම් පරීක්ෂක සේවයේ II ශ්‍රේණිය
iii. ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණිය

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.04.18 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

## 03. වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලයේ සංයුතිය

ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ 3 වන වගන්තියේ සඳහන් විධිවිධාන පරිදි, මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස් විසින් පිහිටුවනු ලබන වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

i. දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය ප්‍රධානියෙකු
ii. දෙපාර්තමේන්තුවේ ආයතන කටයුතු භාර මාණ්ඩලික නිලධාරියෙකු
iii. මධ්‍යම පළාත් ආදායම් පරීක්ෂක නිලධාරීන්ගේ සංඛ්‍යාවෙන් 15% ක නියෝජනයක් සහිත (ජාතික මට්ටමේ නොවන) ලියාපදිංචි වෘත්තීය සමිතීන් නියෝජනය කරමින් එක් නිලධාරියකු බැගින්

## 04. අභියාචනා මණ්ඩලයේ සංයුතිය

ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ 5 වන වගන්තියේ සඳහන් විධිවිධාන පරිදි, අභියාචනා මණ්ඩලය පළාත් පාලන කොමසාරිස්ගෙන් හා පළාත් පාලන කොමසාරිස් විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකුගෙන් (2) සමන්විත වේ. මින් එක් අයෙකු ස්ථාන මාරු මණ්ඩලය නියෝජනය කළ අයෙකු විය යුතුය.

4.2. ස්ථාන මාරුවීම් නියෝග සඳහා එකඟ නොවන නිලධාරීන් සිය අභියාචනය ආයතන ප්‍රධානියා මඟින් ධූරාවලිය ඔස්සේ අභියාචනා මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වේ.

4.3. ස්ථාන මාරු සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා පිළිබඳව මාරු මණ්ඩලයේ නිර්දේශයන් සැලකිල්ලට ගනිමින්, යෝග්‍ය තීරණයක් ගැනීමේ අභිමතය අභියාචනා මණ්ඩලය සතුවේ.

## 05. ස්ථාන මාරු කිරීමට අවශ්‍ය වන සුදුසුකම්,

i. ඉතා ප්‍රියමනාප ස්ථානයක අවුරුදු 05 ක සේවා කාලයක්ද, ප්‍රියමනාප ස්ථානයක අවුරුදු 04 ක සේවා කාලයක්ද, ප්‍රියමනාප නොවන (දුෂ්කර) ස්ථානයක අවුරුදු 03 ක සේවා කාලයක්ද සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු ස්ථාන මාරු ඉල්ලීම් කිරීම සඳහා සුදුසුකම් ලබයි.

ii. ඉතා ප්‍රියමනාප හා ප්‍රියමනාප ස්ථානයක නියමිත සේවා කාලය සම්පූර්ණ නොකරන ලද නිලධාරියෙක් ප්‍රියමනාප නොවන (දුෂ්කර) සේවා ස්ථානයකට ස්ථාන මාරුවක් ඉල්ලා සිටින්නේ නම්, සේවා අවශ්‍යතාවයට යටත්ව එවැනි ස්ථාන මාරුවීමක් ලැබීමට සුදුසුකම් ලබයි.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.04.18 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**06.** වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේදී අදාල වන කොන්දේසි,

i. ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී ප්‍රියමනාප නොවන (දුෂ්කර) සේවා ස්ථානයක සේවා කාලය සම්පූර්ණ කළ අයෙකුට ඉතා ප්‍රිය මනාප, ප්‍රියමනාප ස්ථානයකට ස්ථාන මාරු වීමට අවස්ථාව ලබාදීමට හා සේවා අවශ්‍යතාවයට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

ii. ස්ථාන මාරුවීම් අයදුම් කිරීමේදි මෙහි <u>ඇමුණුම - 01</u> හි ඇතුළත් ආකෘති පත්‍රයට අනුව ඒ සඳහා අයදුම් කළ යුතු වේ.

iii. වර්ෂ 05 ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර ඇති සෑම නිලධාරියෙකුම අදාල ස්ථාන මාරු අයදුම්පත්‍රය අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය. එසේම වර්ෂ 05 ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර ඇති ස්ථාන මාරු අයදුම් නොකරන නිලධාරීන් ස්ථාන මාරු කිරීමට යටත් වන අතර, එම නිලධාරින් පළාතේ ඕනෑම සේවා ස්ථානයකට යාමට කැමති නිලධාරින් ලෙස සළකා කටයුතු කරනු ලබන අතර, ඔවුන් විසින් එවනු ලබන අභියාචනා ද සලකා බලනු නොලැබේ.

iv. ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ සහ නොකළ වසර 05 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින්ගේ තොරතුරු <u>ඇමුණුම - 02</u> හි ඇතුළත් ආකෘති පත්‍රය අනුව අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට ඉදිරිපත් කිරීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වේ. එහිදී අනුමත නිවාඩු (වැටුප් සහිත /රහිත) ලබා සිටින නිලධාරින් වේ නම් එම නිලධාරින්ගේ ද තොරතුරු ඇතුළත් කළ යුතු අතර නිවාඩු කාල සීමාව ද සඳහන් කළ යුතු වේ.

v. <u>ස්ථාන මාරු තීරණ</u> වලට විරුද්ධව කෙරෙන අභියාචනා ඉදිරිපත් කිරීමේදී <u>ඇමුණුම - 03</u> හි ඇතුළත් ආකෘතිපත්‍රයට අනුව ඉදිරිපත් කළ යුතු වේ.

vi. <u>ස්ථාන මාරු නියෝග</u> වලින් අතෘප්තියට පත් නිලධාරින් එයට එරෙහිව සිදු කරනු ලබන අභියාචනයන් වෙතොත් ඒ සම්බන්ධයෙන් <u>ඇමුණුම - 04</u> හි ඇතුළත් ආකෘතිපත්‍රයට අනුව නිලධාරියාගේ අභියාචනය ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ.

vii. ප්‍රියමනාප නොවන (දුෂ්කර) ස්ථානයකට වෙනත් ඉල්ලීමක් නොමැත්තේ නම්, නියමිත කාලයට වඩා වුවද එම ස්ථානයේ සේවය කරනු ලබන නිලධාරියාට තමා කැමති නම් දිගටම එම ස්ථානයේ සේවය කිරීමට ඉඩ දෙනු ඇත.

viii. ස්ථාන මාරුවීම් වලදී සුදුසුකම් ලබන සේවා කාලය ගණනය කරනු ලබන්නේ අදාල වර්ෂයේ ජූනි 30 දිනටය.

ix. ප්‍රියමනාප නොවන (දුෂ්කර) ස්ථානයක සේවය කර නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප ස්ථානයකට මාරුවීමක් දීමට සිදු වන අවස්ථාවක දී එම ස්ථානයෙහි නියමිත සේවා කාලය සම්පූර්ණ කර නොතිබුණ ද එහි වැඩිම සේවා කාලයක් ඇති නිලධාරියා ඉන් පිටතට මාරු කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.04.18 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

x. නිලධාරියා මෙන්ම ඔහුගේ/ ඇයගේ පවුලේ අයටද ඇති වන අපහසුතාවය අවම කිරීමට හැකි වන සේ ස්ථාන මාරුවක් ලබා දීමට ස්ථාන මාරු මණ්ඩලයට පහසු වනු පිණිස නිලධාරීන් විසින් තමා ඉල්ලා සිටින සේවා ස්ථානයට අමතරව තවත් විකල්ප ස්ථාන 02 ක් ඉල්ලුම්පත්‍රයේ අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

xi. භාර්යාව හා ස්වාමි පුරුෂයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුක්ත නම් නිලධාරියාගේ ඉල්ලීම අනුව එකම ප්‍රදේශයක සේවය කිරීමට ඉඩ ලබා දීම පිළිබඳව සලකා බලනු ලැබේ.

xii. ප්‍රිය මනාප නොවන (දුෂ්කර) කාර්ය ස්ථානයන්හි සේවය සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී පාසැල් යන දරුවන් ඇති විවාහක නිලධාරීන්ට වඩා අවිවාහක නිලධාරීන්ද, පාසල් යන දරුවන් නොමැති විවාහක නිලධාරීන්ද හැකි සෑම අවස්ථාවකදීම තෝරා ගැනීමට සැලකිලිමත් වේ.

xiii. ඉතා ප්‍රිය මනාප හෝ ප්‍රිය මනාප සේවා ස්ථාන වල සේවය කරන නිලධාරීන්ගේ ඉල්ලීම් සලකා බලනු ලබන්නේ දුෂ්කර සේවා ස්ථාන වල සේවය කරනු ලබන නිලධාරීන්ගේ ඉල්ලීම් සලකා බැලීමෙන් පසුවය.

xiv. ඉතා ප්‍රියමනාප ස්ථානයක නියමිත සේවා කාලය සේවය කර ස්ථාන මාරු කළ නිලධාරියෙකුට වසර 10 ගතවන තුරු නැවත එම සේවා ස්ථානයට ස්ථාන මාරුවීම සඳහා අවස්ථාවක් ලබා දෙනුයේ ඒ සඳහා වෙනත් ඉල්ලීමක් නොමැති නම් පමණි.

xv. ස්ථාන මාරු කිරීමේ දී ඉතා ප්‍රිය මනාප හෝ ප්‍රිය මනාප ස්ථානවල සේවය කළ නිලධාරින් දුෂ්කර ස්ථාන වලට මාරු කිරීමට නියෝග කිරීමට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ.

xvi. ඉතා ප්‍රිය මනාප හෝ ප්‍රිය මනාප සේවා ස්ථාන වල අදාල සේවා කාලය සම්පූර්ණ කළ නිලධාරියෙක් නැවත ඉතා ප්‍රිය මනාප හෝ ප්‍රිය මනාප සේවා ස්ථානයකට මාරුවීමක් ඉල්ලා ඇති විට, එම ඉල්ලීම සලකා බලනු ලබන්නේ දුෂ්කර සේවා ස්ථාන වල නිලධාරීන්ගේ එම ස්ථාන මාරු ලබා ගැනීමට ඉල්ලීමක් නොමැති වුවහොත් පමණි.

xvii. ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම් කරන නිලධාරියකුට තමා ස්ථිර පදිංචියට අදාල පළාත් පාලන ආයතනය වෙත ස්ථාන මාරුවීමට ඉල්ලීම් කළ නොහැක.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.04.18 දින
අනුමත කරන ලදී.
(signature)
ආණ්ඩුකාර ලේකම්

## 07. සේවා ස්ථාන වර්ගීකරණය

මධ්‍යම පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන ආයතනවල භූගෝලීය පිහිටීම හා ඒ මත නිර්මාණය වී ඇති පහසුකම් හා දුෂ්කරතා , මානව,භෞතික සම්පත් සහ නිලධාරීන්ගේ ඉල්ලුම පදනම් කර ගනිමින් වාර්ෂිකව සමාලෝචනය කිරීමට යටත්ව පහත සඳහන් පරිදි වර්ග කරනු ලැබේ.ඒ අනුව නිලධාරීන් විසින් ස්ථාන මාරු ඉල්ලුම් කළ යුතුය.

| දිස්ත්‍රික්කය | පළාත් පාලන ආයතන වර්ගීකරණය | | |
|---|---|---|---|
| | ඉතා ප්‍රිය මනාප(A) | ප්‍රිය මනාප(B) | ප්‍රිය මනාප නොවන (දුෂ්කර) (C) |
| මහනුවර | • මහනුවර ම.න.ස.<br>• ගම්පල න.ස.<br>• කඩුගන්නාව න.ස.<br>• වත්තේගම න.ස.<br>• නාවලපිටිය න.ස.<br>• ගඟවට කෝරළේ ප්‍රා.ස.<br>• හාරිස්පත්තුව ප්‍රා.ස.<br>• යටිනුවර ප්‍රා.ස.<br>• අකුරණ ප්‍රා.ස.<br>• පාතදුම්බර ප්‍රා.ස.<br>• කුණ්ඩසාලේ ප්‍රා.ස. | • උඩුනුවර ප්‍රා.ස.<br>• මැදදුම්බර ප්‍රා.ස.<br>• තුම්පනේ ප්‍රා.ස.<br>• පූජාපිටිය ප්‍රා.ස.<br>• පස්බාගේ කෝරළේ ප්‍රා.ස.<br>• උඩපළාත ප්‍රා.ස.<br>• පාතහේවාහැට ප්‍රා.ස. | • උඩදුම්බර ප්‍රා.ස.<br>• මිනිපේ ප්‍රා.ස.<br>• ගඟඉහළ කෝරළේ ප්‍රා.ස.<br>• පන්විල ප්‍රා.ස. |
| මාතලේ | • මාතලේ ම.න.ස.<br>• දඹුල්ල ම.න.ස<br>• උකුවෙල ප්‍රා.ස.<br>• මාතලේ ප්‍රා.ස. | • ගලේවෙල ප්‍රා.ස.<br>• යටවත්ත ප්‍රා.ස.<br>• පල්ලේපොල ප්‍රා.ස.<br>• නාඋල ප්‍රා.ස.<br>• රත්තොට ප්‍රා.ස.<br>• දඹුල්ල ප්‍රා.ස. | • විල්ගමුව ප්‍රා.ස.<br>• ලග්ගල පල්ලේගම ප්‍රා.ස.<br>• අඹන්ගඟ කෝරළේ ප්‍රා.ස. |
| නුවරඑළිය | • නුවරඑළිය ම.න.ස.<br>• හැටන් දික්ඔය න.ස. | • තලවකැලේ ලිඳුල න.ස.<br>• හඟුරන්කෙත ප්‍රා.ස.<br>• නුවරඑළිය ප්‍රා.ස.<br>• කොටගල ප්‍රා.ස. | • වලපනේ ප්‍රා.ස.<br>• අඹගමුව ප්‍රා.ස.<br>• කොත්මලේ ප්‍රා.ස.<br>• මස්කෙළිය ප්‍රා.ස.<br>• නෝර්වුඩ් ප්‍රා.ස.<br>• ආගරපතන ප්‍රා.ස. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.04.18 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**08.** වාර්ෂික ස්ථාන මාරු කාල සටහන

| | | |
|---|---|---|
| i. | අයදුම්පත් කැඳවීම | - ජූලි 15 |
| ii. | අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය | - අගෝස්තු 15 |
| iii. | ස්ථාන මාරු මණ්ඩලය රැස්වීම | - සැප්තැම්බර් 15 |
| iv. | ස්ථාන මාරු තීරණ දැනුම් දීම | - ඔක්තෝබර් 01 |
| v. | අභියාචනා භාර ගැනීමේ අවසාන දිනය | - ඔක්තෝබර් 15 |
| vi. | ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම | - නොවැම්බර් 01 |
| vii. | ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම | - ජනවාරි 01 |

**09.** වෙනත් කරුණු

i. ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියළුම නිලධාරීන් නියමිත දිනයේදී නව රාජකාරි ස්ථානය වෙත වාර්තා කිරීමට බැඳී සිටිය යුතුය.

ii. ස්ථාන මාරුවීම් නියෝග ලැබ සිටින නිලධාරියෙකු එම මාරු වීම ක්‍රියාත්මක වන දිනයෙන් පසු එම ආයතනයේ සේවයෙන් මුදා නොහැරීම ස්ථානමාරු පරිපාටියට පටහැනිය. ස්ථාන මාරු මණ්ඩලය මගින් ස්ථාන මාරු කර ඇති නිලධාරීන් අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන, නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි මුදා හැරීමට ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

iii. ස්ථාන මාරු ලැබීමට ඉඩ ප්‍රස්ථා ඇතැයි සිතන කිසියම් නිලධාරියෙකු සේවා අවශ්‍යතාවය මත තවත් වර්ෂයක් හෝ ඊට අඩු කාලයක් තම ආයතනයේ රඳවා ගත යුතු යැයි ආයතන ප්‍රධානියා අදහස් කරන්නේ නම්, ඒ සඳහා වන හේතු පැහැදිලි කරමින් සිය නිර්දේශය ඉල්ලුම්පත්‍රය යොමු කරන අවස්ථාවේදීම ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන කොමසාරිස් විසින් මාරු මණ්ඩලයට ඒ පිළිබඳව දැනුම් දී ක්‍රියා කරනු ඇත. එක් ආයතනයකට අනුයුක්ත නිලධාරි සංඛ්‍යාවෙන් 1/3 කට නොවැඩි නිලධාරි පිරිසක් සඳහා පමණක් මේ සඳහා ඉල්ලුම් කළ හැකිය. එක් වතාවකදී මෙම අවස්ථාව ලබා දී ඇති නිලධාරියෙකු සඳහා නැවත අවස්ථාවක් ලබා දෙනු නොලැබේ.

iv. නිලධාරියෙකුගේ ඉල්ලීමක් අනුව කරන ලද මාරුවීමක් අවලංගු කරන ලෙස හෝ කල් දමන ලෙසට ස්ථාන මාරුව සිදු කරන අවස්ථාවෙන් පසුව පැන නැගී කරුණු වලින් තොරව ඉදිරිපත් කිරීමට හෝ නිර්දේශ ඉදිරිපත් කිරීම ආයතන ප්‍රධානියා විසින් නොකළ යුතුය.

v. මාරු මණ්ඩලය විසින් නිලධාරීන් මාරු කිරීමේදී ඒ ඒ ආයතනයේ සේවා අවශ්‍යතාවයද, කාර්ය මණ්ඩල සමබරතාවය රැකීමටද , සේවා පළපුරුද්ද නිලධාරීන්ට ලබා දීමට සැලසීමට ද හැම විටම උත්සාහ කරනු ඇත.

10. මෙම ස්ථාන මාරු පරිපාටිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ III වැනි පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන වලට යටත්ව සකසා ඇත.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.04.18 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

| කාර්යාලීය ප්‍රායෝජනය සඳහා පමණි | |
|---|---|

**මධ්‍යම පළාත්,පළාත් පාලන ආයතනවල ආදායම් පරීක්ෂක සේවයේ නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රය**

01. දැනට සේවය කරන ආයතනය -: ........................................................................................

02. I. නිලධාරියාගේ සම්පූර්ණ නම -: ........................................................................................
........................................................................................මයා/මිය/මෙනවිය

II. මුලකුරු සමඟ නම -: ........................................................................................

III. ජාතික හැඳුනුම්පත් අංකය -: ........................................................................................

03. I. ස්ථිර පෞද්ගලික ලිපිනය:
..........................................................
..........................................................
..........................................................
..........................................................

II. දැනට පදිංචි ස්ථානයේ ලිපිනය:
..........................................................
..........................................................
..........................................................
..........................................................

III. දුරකථන අංකය - (පෞද්ගලික) -: ........................................................................

04. I. උපන් දිනය -: ........................................................................

II. ................... .06.30 දිනට වයස -: අවු............. මාස ........... දින............

III. ස්ත්‍රී/පුරුෂ භාවය -: ........................................................................

05. I. නිලධාරියා විවාහක/ අවිවාහක ද යන බව -: ......................................

II. දරුවන් ගණන, ඔවුන්ගේ නම්, වයස් හා පාසල් -:

| අනු අංකය | දරුවන්ගේ නම් | වයස (අවු.) | පාසල |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

III. කලත්‍රයාගේ නම -: ........................................................................................

IV. කලත්‍රයාගේ සේවා ස්ථානය -: ........................................................................
කලත්‍රයා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිසියේ සේවයේ ක්‍රියාත්මක සේවයේ යුතුද? එසේ නම් ඔහු/ ඇය අයත්වන සේවාව හා තනතුර -: ........................................................................

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019 . 04 . 18 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

06 I. මධ්‍යම පළාත් ආදායම් පරීක්ෂක සේවයට අන්තර්ග්‍රහණය වී ඇති අයෙක්ද යන්න -: ඔව්/ නැත

II. එසේ අන්තර්ග්‍රහණය වී ඇත්නම් ඊට පෙර දැරූ තනතුරු නාමය -: ........................................

III. අන්තර්ග්‍රහණය වූ ශ්‍රේණිය හා දිනය -: ........................................

IV. දැනට සිටින ශ්‍රේණිය -: ............................................................

V. එම ශ්‍රේණියට පත් වූ දිනය -: .....................................................

VI. මුල් පත්වීමේ දිනය -: ..............................................................

07. සේවයට ඇතුලත් වූ දින සිට මේ දක්වා එක් එක් කාර්ය ස්ථානයක සේවය කර ඇති සේවා විස්තර :

| කාර්ය ස්ථානය | සේවා ස්ථාන වර්ගීකරණය අනුව සේවා ස්ථානයේ වර්ගය (A,B,C) | සේවය කළ කාල සීමාව(වර්ෂය,මාසය,දිනය) | | මුළු සේවා කාලය (අවු.) |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

(සැලකිය යුතුය -: මෙහිදී අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සැපයීම නොකළ යුතු අතර, කාර්ය ස්ථාන පිළිබඳව විස්තර ඉතා වැදගත් බැවින් ඉහත ඉඩකඩ ප්‍රමාණවත් නොවේනම් වෙනත් අනුරූප ඇමුණුමක් ඇතුළත් කළ යුතු වේ.

**08.** I. ස්ථාන මාරුව ඉල්ලා සිටින සේවා ස්ථානය සම්බන්ධ තොරතුරු -:

| අනු අංකය | ස්ථාන මාරුව ඉල්ලා සිටින ආයතනයේ නම | වර්ගීකරණය අනුව සේවා ස්ථානයේ වර්ගය ( A,B,C) |
|---|---|---|
| 1 | | |
| 2 | | |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.04.18 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

II. ස්ථාන මාරුව ඉල්ලා සිටින විකල්ප සේවා ස්ථාන සම්බන්ධ තොරතුරු -:

| අනු අංකය | ස්ථාන මාරුව ඉල්ලා සිටින ආයතනයේ නම | වර්ගීකරණය අනුව සේවා ස්ථානයේ වර්ගය ( A,B,C) |
|---|---|---|
| 1 | | |
| 2 | | |

09. ස්ථාන මාරු ඉල්ලීමට හේතු:-

- ..............................................................................................................
- ..............................................................................................................
- ..............................................................................................................
- ..............................................................................................................
- ..............................................................................................................

( සැළකිය යුතුය -: නිලධාරියාගේ හෝ යැපෙන්නන් යම් ආබාධිත තත්ත්වයකින් පෙළෙන්නේ නම් ඒ බව වෛද්‍ය සහතික මඟින් තහවුරු කිරීමට යටත්වය.)

10. විශේෂයෙන් සඳහන් කිරීමට වෙනත් හේතු ඇත්නම්,

..............................................................................................................
..............................................................................................................
..............................................................................................................
..............................................................................................................
..........................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බව මම ප්‍රකාශ කරමි.මා විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා හට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බව මම දනිමි.

දිනය -: .......................................                ...............................................................

නිලධාරියාගේ අත්සන

11. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය -:

ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි.සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව /රහිතව/පසුව ලබා දීමේ පදනම මත නිලධාරියා නිදහස් කළ හැකිය. නිර්දේශ කරමි/නොකරමි.

දිනය -: .......................................                ...............................................................

අත්සන හා නිල මුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.04.18 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම - 02

| කාර්යාලීය ප්‍රායෝජනය සඳහා පමණි | |
|---|---|

**<u>අවු 05 කට වැඩි කාලයක් සේවය කර ඇති ආදායම් පරීක්ෂක සේවයේ සියළුම නිලධාරින් සම්බන්ධයෙන්</u>**
**<u>ආයතන ප්‍රධානියා විසින් සැපයිය යුතු වාර්තාව</u>**

එක් සේවා ස්ථානයක අවු 05 කට වැඩි කාලයක් සේවය කර ඇති ආදායම් පරීක්ෂක සේවයේ සියළුම නිලධාරින්ගේ විස්තර මෙහි අනිවාර්යෙන් ඇතුළත් කළ යුතු බව සළකන්න.වැඩිම සේවා කාලයක් ඇති නිලධාරින්ගේ නම මුලින්ම ඇතුළත් කළ යුතුය.(සේවා කාලය ගණනය කළ යුත්තේ පවත්නා වර්ෂයේ ජුනි 30 වන දිනටයි.)

පළාත් පාලන ආයතනය-: ..........................................................................................

| නිලධාරියාගේ නම(මයා/මිය/මෙනවිය) | ජාතික හැඳුනුම්පත් අංකය | තනතුර හා ශ්‍රේණිය | උපන් දිනය හා 201...06..30 දිනට වයස | වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය (ජුනි 30 දිනට) | විවාහක/ අවිවාහක බව | කලත්‍රයාගේ සේවා ස්ථානය | දරුවන් සංඛ්‍යාව හා පාසල් යන දරුවන් සංඛ්‍යාව | ස්ථිර පදිංචි ලිපිනය | මුල් පත්වීමේ දින සිට සේවය කළ සේවා ස්ථාන හා සේවය කළ කාලසීමාවන් (මේ සඳහා ඉඩ කඩ ප්‍රමාණවත් නොවේ නම් වෙනත් ඇමුණුමක් භාවිතා කරන්න) | වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර තිබේද? අයදුම් කර නොමැති වුවත් ස්ථාන මාරු වක් ලැබුණහොත් සේවය කිරීමට කැමති ආයතන 03ක් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

සකස් කළේ -:අත්සන :..................................................
නම :..................................................
දිනය :..................................................

පරීක්ෂා කළේ -:අත්සන :..................................................
නම :..................................................
දිනය :..................................................

මෙම ආයතනයේ අවුරුදු 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මධ්‍යම පළාතේ ආදායම් පරීක්ෂක සේවයේ සියළුම නිලධාරින් පිළිබඳ විස්තර මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බවත්,සියළුම තොරතුරු නිවැරදි බවත් මෙයින් සහතික කරමි.සාවද්‍ය තොරතුරු සැපයීම සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ හැකි බව සැලකිල්ලට ගනිමින් සහතික කරමි.

..........................................................
අත්සන හා නිල මුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.04.18 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම- 03

(ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.)

| කාර්යාලීය ප්‍රායෝජනය සඳහා පමණි | |
|---|---|

නම -: ..............................................................

තනතුර -: ..............................................................

ලිපිනය -: ..............................................................

දිනය -: ..............................................................

නාගරික කොමසාරිස්/ලේකම්,
...............................................මහ නගර සභාව/නගර සභාව/ප්‍රාදේශීය සභාව මගින්,

පළාත් පාලන කොමසාරිස්,
පළාත් පාලන දෙපාර්තමේන්තුව,
මධ්‍යම පළාත.

<u>ස්ථාන මාරු තීරණ සඳහා එකඟ නොවන නිලධාරීන් විසින් කරනු ලබන අභියාචනය</u>

ඔබගේ අංක ............................................ හා ............................... දිනැති ලිපිය/යෝජිත වාර්ෂික ස්ථාන මාරු ලේඛනය මගින් මා ......................................................................... ට ස්ථාන මාරු කිරීමට යෝජිත බව දන්වා ඇත./අයදුම්පත ප්‍රතික්ෂේප වී ඇති බව දන්වා ඇත/මා විසින් ඉදිරිපත් කළ ........................................................ දිනැති ස්ථාන මාරු අයදුම්පත අනුව ස්ථාන මාරු ලබා දී නොමැත.

02. පහතින් විස්තර කරනු ලබන කරුණු මත එම යෝජිත ස්ථාන මාරුව අවලංගු කරන ලෙස/සංශෝධනය කරන ලෙස/නැවත සලකා බලන ලෙස/ස්ථාන මාරුවක් ලබා දෙන ලෙස/ප්‍රතික්ෂේපිත අයදුම්පත සලකා බලන ලෙස ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

2.1. ..............................................................................................................

2.2 ..............................................................................................................

2.3. ..............................................................................................................

03. ඉහතින් සඳහන් කරුණු සනාථ කිරීම සඳහා අදාළ පහත සඳහන් ලියවිලි වල සහතික කළ ඡායා පිටපත් මේ සමඟ යා කර ඇත.

..............................................................................................................

..............................................................................................................

04. මාගේ වාර්ෂික ස්ථාන මාරුව පහත සඳහන් සේවා ස්ථානයකට ලබා දෙන ලෙස ද ඉල්ලමි.

- පළමු මනාපය ..........................................
- දෙවන මනාපය ..........................................
- තෙවන මනාපය ..........................................

......................................
අත්සන

05. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය-:

පළාත් පාලන කොමසාරිස්,
.........................................................................විසින් ඉහතින් දක්වා ඇති කරුණු සත්‍ය බවට සෑහීමකට පත්වෙමි./නොවෙමි. ඉල්ලීම ඉටු කිරීම නිර්දේශ කරමි /නොකරමි.

දිනය -: ......................................                ..................................................
අත්සන හා නිලමුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.04.18 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම-04

| කාර්යාලීය ප්‍රායෝජනය සඳහා පමණි | |
|---|---|

**<u>මධ්‍යම පළාත්,පළාත් පාලන ආයතනවල ආදායම් පරීක්ෂක සේවයේ වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනය</u>**

01. දැනට සේවය කරන ආයතනය -: ..............................................................................

02. I. නිලධාරියාගේ සම්පූර්ණ නම -: ..............................................................................
..............................................................................මයා/මිය/මෙනවිය
II. මුලකුරු සමඟ නම -: ..............................................................................
III. ශ්‍රේණිය -: ..............................................................................

03. අභියාචනයට පදනම්ව ඇති තීරණය/නියෝගය පිළිබඳ විස්තර

I. තීරණය/නියෝගය කුමක්ද?යන වග සැකෙවින්
..............................................................................
..............................................................................

II. තීරණය/නියෝගය දෙන ලද්දේ කා විසින් ද?
..............................................................................

III. තීරණය/නියෝගය නිලධාරියාට ලැබුණු දිනය -: ..............................................................................

IV. තීරණය/නියෝගය දැක්වෙන ලිපිවල සහතික කළ පිටපත් පහතින් දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.
ඇමුණුම 01 -: ..............................................................................
ඇමුණුම02 -: ..............................................................................

04. I. තීරණයට /නියෝගයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු -:
..............................................................................
..............................................................................

II. මෙම හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධක වල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.

ඇමුණුම 01 -: ..............................................................................
ඇමුණුම 02 -: ..............................................................................
ඇමුණුම 03 -: ..............................................................................

05. ඉල්ලා සිටිනු ලබන සහන -: ..............................................................................
..............................................................................

දිනය-: ..................................... ..............................................................................

අත්සන හා නිල මුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.04.18 දින
අනුමත කරනු ලැබී.
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- නිර්දේශ කරමු.

| | | |
|---|---|---|
| 01. ටී.බී.එච්.දුනුවිල මහතා | (සභාපති) | ........................ |
| 02. ඩබ්ලිව්.එම්.එස්.ඩී.වීරකොන් මහතා | (සාමාජික) | ........................ |
| 03. ඒ.එම්.වයිස් මහතා | (සාමාජික) | ........................ |
| 04. ඒ.එම්.ආර්.බී.තෙන්නකෝන් මහතා | (සාමාජික) | ........................ |
| 05.එන්.ඩී.කේ.පියුම්සිරි මහතා | (සාමාජික) | ........................ |
| 06.ජී.තෙන්නකෝන් මහතා | (සාමාජික) | ........................ |
| 07.කේ.ආර්.ක්‍රිෂාන් මහතා | (සාමාජික) | ........................ |

දිනය 2019/03/19.........

ආණ්ඩුකාර ලේකම්,

2019/03/19....දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 19/356........ යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත්, පළාත් පාලන ආයතනවල ආදායම් පරීක්ෂක සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය ....29/3/2019....

........................................
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

නිල මුද්‍රාව එල් ඒ. සුජාතා විජේසිංහ
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය :- අනුමත කරමි. / නොකරමි.

අනුමත කරමි / නොකරමි

ජනාධිපති නීතිඥ
මෛත්‍රී ගුණරත්න
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත.

2019.04.18........